# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 9 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ 2005 මාර්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 අප්‍රේල් මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.50 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2005 අංක 9 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 මාර්තු මස 31 වන දින]

එල්. ඩී.– ඕ. 10/2005

## 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1.** මේ පනත 2005 අංක 9 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු පනතේ 2 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "මේ පනතේ උපලේඛනයෙහි පිළිවෙලින් දක්වා ඇති අනුප්‍රමාණ අනුව" යන වචන වෙනුවට "මේ පනතේ උපලේඛනයෙහි පිළිවෙලින් දක්වා ඇති මුදල් ප්‍රමාණවලට සමාන මුදලක" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:– 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ඉවත් කර පහත දැක්වෙන උපලේඛනය මෙයින් ආදේශ කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

"උපලේඛනය

(2 වන වගන්තිය)

1 වන කොටස

බුකිකරුවකු ලෙස ව්‍යාපාරය කරගෙන යන තැනැත්තකු විසින් මෙහි I වන තීරුවේ නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහාම, ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය, මෙහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් මුදල හා සමාන මුදලක් විය යුතු ය.

2—PL000176—4,500 (2005/03)

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| *වර්ෂය* | *බදු මුදල් ප්‍රමාණය* |
| 1. 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක්ම සඳහා | රුපියල් එක්ලක්ෂයක් |
| 2. 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක්ම සඳහා | රුපියල් මිලියන එකක් |
| 3. 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2005 අප්‍රේල් මස1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක්ම සඳහා — | |
| (i) ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත කරන අවස්ථාවක | රුපියල් තිස් දහසක් |
| (ii) ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත නොකරන අවස්ථාවක | රුපියල් දස දහසක් |
| 4. 2005 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක් සඳහා- | |
| (i) අනුයෝජිතයන් මාර්ගයෙන් කරන ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාරය සඳහා | රුපියල් මිලියන එකක් |
| (ii) ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත කරන අවස්ථාවක | රුපියල් දෙලක්ෂ පනස් දහසක් |
| (iii) ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිත නොකරන අවස්ථාවක | රුපියල් විසිපන් දහසක් |

II වන කොටස

සූදු ව්‍යාපාරය පවත්වාගෙන යන තැනැත්තකු විසින්, මෙහි I වන තීරුවේ නිශ්චිතව සඳහන් සෑම වර්ෂයක් සඳහා ම ගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය මෙහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් මුදල් හා සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| *වර්ෂය* | *බදු මුදල් ප්‍රමාණය* |
| 1. 1988 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2001 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම මුදල් වර්ෂයක් ම සඳහා | රුපියල් මිලියන එකක් |
| 2. 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා | රුපියල් මිලියන විසිපහක් |
| 3. 2002 අප්‍රේල් මස 1 වන දින හේ ඉන් පසුව එහෙත් 2005 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන සෑම වර්ෂයක් ම සඳහා — | |
| (i) සූදු ව්‍යාපාරය (රූජිනෝ ක්‍රීඩාව කිරීම හැර) පවත්වාගෙන යාම සඳහා | රුපියල් මිලියන දොළහක් |
| (ii) රූජිනෝ ක්‍රීඩාව පමණක් ක්‍රීඩා කිරීමේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා | රුපියල් පන්ලක්ෂයක් |
| 4. 2005 අප්‍රේල් මස1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම වර්ෂයක්ම සඳහා රූජිනෝ ක්‍රීඩාව කිරීම ඇතුළුව සූදු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා | රුපියල් මිලියන පණහක්.”. |

4. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.